# රස්සා ගන්න මැලේසියාවට ගිය ශ්‍රී ලාංකිකයෝ සිය ගණනක් අතරමං

## ආපසු ලංකාවට එවන්න තානාපති කාර්යාලයේ නිලධාරියකු එක් අයකුගෙන් රු. 54,000 ක් ඉල්ලනවා

(ජයන්ත සමරකෝන් මැලේසියාවේ සංචාරයෙන් පසු)

### ක්වාලාලම්පූර්හි හිරවූ ජාඇල සමීර කියයි

මැලේසියාවේ ඉහළ වැටුප් සහිත කාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා ඒජන්සිකරුවන්ට රුපියල් ලක්ෂ ගණනින් මුදල් ගෙවා එහි ගිය ශ්‍රී ලාංකිකයන් සිය ගණනක් එහි අතරමංව සිටින බව ක්වාලාලම්පූර් නගරයේ කරන ලද සංචාරයකදී අනාවරණය විය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි රැකියා ඒජන්සිකරුවන්ගේ වංචනික ක්‍රියාවන්ට හසුවූ තමන් ආපසු ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා රජයේ කිසිදු වගකිවයුතු ආයතනයක් මැදිහත් වී නැති බවට ඔව්හු චෝදනා කළහ.

6 වැනි පිටුවට

### රස්සා ගන්න මැලේසියාවට...

1 වැනි පිටුවෙන්...

පොරොන්දු වූ රැකියාව හෝ වැටුප වෙනුවට තමන් ඈත කැලෑ බද පෙදෙස්වල කර්කශ කම්කරු රැකියාවන්හි යෙදවීම නිසා එම ස්ථානවලින් පලා ආ බවද ඔව්හු පැවසූහ.

මොවුන්ගේ ගමන් බලපත්‍ර එම ආයතන හිමිකරුවන්ගේ භාරයට ගැනීම නිසා ආගමන විගමන නිලධාරීන්ට හා පොලිසියට හසු නොවී තැන තැන සැඟවී සිටින බව ද මැලේසියානු ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට මේ බැව් දැනුම් දීමෙන් පසු ශ්‍රී ලංකාවට යැවීම සඳහා එහි නිලධාරියකු රුපියල් 54000 ක් ඉල්ලා සිටි බවද මේ පිළිබඳව ලංකාදීපයට අදහස් දැක්වූ ජා ඇල සමීර නෝනිස් මහතා (25) පැවැසීය.

ඔහු මෙසේද කීය. "රජයේ අනුමත රැකියා ඒජන්සියකට රුපියල් ලක්ෂ 1 1/2 ක් බැගින් දීලා අපි 10 දෙනෙක් ජනවාරි 5 දා මැලේසියාවේ කාර්මික අංශයේ (ඉලෙක්ට්‍රොනික්) රස්සාවලට ආවා.

මෙහේ රැකියා ඒජන්ත අපි දහ දෙනා බාරගෙන මලක්කාවල පිහිටි ලී මෝලකට ගෙනහින් දැම්මා. ඒකේ ගිනියම් වන බොයිලේරුවක රෑ දවල් වැඩ කරන්නට කිව්වා. සති දෙකකට පස්සේ අපි පැනලා ආවා. එම්බසියට ඇවිත් මාස 3 ක් වෙනවා. අපි 22 දෙනෙක් එතැන කුඩා කාමරයක ඉන්නේ. ආපහු ලංකාවට යන්නට නම් එම්බසියේ නිලධාරියා ඉල්ලන සල්ලි අපි කොහෙන් හරි ලබාදිය යුතුයි. රස්සාවක් කරලා හරි ගෙනත් දෙන්නලු. නැත්නම් ලංකාවේ ඉන්න ඥාතීන්ට කියන්නලු. එයා කියන ගිණුමකට මුදල් දාන්න කියලා.

බිරිඳගේ රත්රන් බඩු ටික උගස්කරලයි මම මෙහෙ ආවේ

අපිත් එක්ක හිටපු 6 දෙනෙක් ඒ විදියට මුදල් ගෙවලා ලංකාවට ගියා."

අනුරාධපුර, නාච්චාදූවේ මොහොමඩ් ෆව්සි (25) මහතා මෙසේ පැවසීය.

"රුපියල් ලක්ෂ 2ක් ඒජන්සියට දීලයි මම ආවේ. මෙහේ ඒජන්තලා පස් දෙනෙක් ඉන්නවා. ලංකාවෙන් මෙහාට රස්සාවලට එන අය තැන් තැන්වලට විකුණලා ඔවුන් මුදල් ලබාගන්නවා. ලී මෝලෙන් පැනලා අපි එම්බසියට ඇවිත් මාස 03 ක් වෙනවා. අපි 17 ක් ලංකාවට යවන බව හැමදාම කියනවා. මුදල් ගෙවූ (රු.54000) හැම කෙනෙක්ම පහු වෙනිදා ලංකාවේ.

සේවා කොන්දේසි සම්බන්ධ ගිවිසුම්වලට කාර්යාංශයේදී අස්සන් කලාට පස්සේ එයාර් පෝට් එකේදී ඒවා සූක්ෂ්ම විදියට වෙනස් කර සංචාරක වීසාවලින් අපිව ගෙනැත් තියෙන බව හෙළි වී තිබෙනවා.

රස්සාවලින් පැනලා එන අයගේ මුදල්, ෆෝන්, රත්රන් බඩු කොල්ලකාලා ඒ අයට පහරදීලා නැවතත් ඒ තැන්වලට බාර දෙන කල්ලියක්ද මෙහේ ඉන්නවා.

පොලිසියට අහු වුණාම කරන්නේ සියලුම දේ කොල්ලකාලා පහරදීලා පලවා හරින එකයි."

මැලේසියාවේදී අපට හමුවූ ජා ඇල එම්.එස්.එස්. අල්විස් (33) මහතා මෙසේ පැවැසීය.

"මම විවාහකයි. දරුවන් දෙදෙනෙක් සිටිනවා. රුපියල් 1,40,000 ක් පොලියට අරගෙන ඒජන්සියට දීලයි මෙහාට ආවේ.

දැන් එම්බසියට වෙලා මාස 3ක්. වට්ටක්කයි බතුයි කකා ඉන්නවා. බ්‍රික්ෆීල්ඩ් මහා විහාරයෙන් අපට කෑමට අවශ්‍ය දේවල් ලැබෙනවා.

මහරගම ඒ.ජී. රොෂාන් (20) මහතා

අපි 10 ක් නීත්‍යානුකූල නොවන ඒජන්සියකට රුපියල් 1,20,000 ගානේ දීල මෙහාට ඇවිත් දැන් මාස 2ක් වෙනවා. රුපියල් 65000 ක විතර වැටුපක් ලබාගන්ට පුළුවන් රස්සාවකට දානවා කියල ගෙනත් මාව ෆාම් එකක කුකුල්ලු මරන්නට දැම්මා. එහෙන් මම පැනලා ඇවිත් දැන් එම්බසියේ ඉන්නේ. ආයිත් යන්න කියලා ඒජන්සියේ ඒජන්තයින් මට පහර දුන්නා. මේ විදියට රස්සාවල්වලට දාපු හුඟක් දෙනෙක් ඈත ප්‍රදේශවල ඉන්නවා. ඒ අය එම්බසියට එන්ට දන්නේ නැහැ."

දූම්මලසූරිය අමිල ප්‍රියංකර මහතා (25) මෙසේ කීය. ඒජන්සියකට රුපියල් ලක්ෂ 2 ක් දීලා ඇවිත් මාස 3 ක් වෙනවා. මාව දැම්මේ කාර් හෝදන්ටයි.

හලාවත අමල් ක්‍රිශාන්ත (20) මහතා ලක්ෂ 2ක් දීලා ඇවිත් දැන් එම්බසියේ ඉන්නේ. ලංකාවට යන්ට විදිහක් නැහැ. අපි නොදැනුවත්කම නිසයි මේ අමාරුවේ වැටුණේ.

මැලේසියාවේ පෞද්ගලික බැංකුවක සේවය කරන ශ්‍රී ලාංකිකයෙකු වන එරන්දික නුංගම්පොල මහතා- මැලේසියාවේ රැකියාවලට කියලා ඒජන්සිකාරයින්ගේ ජාවාරම්වලට අහුවුණු ශ්‍රී ලාංකිකයන් ඇතුළු විදේශීය ජාතිකයින් දස දහසක් පමණ නීති විරෝධී ලෙස මෙරට රැඳී සිටිනවා.

පසුගිය මාස 3ට පමණක් අතරමං වුණු ශ්‍රී ලාංකිකයින් 100ක් පමණ ආපසු ගිහින් තියෙනවා. ඒ වුණාට ඒජන්සිකාරයින්ගේ ප්‍රචාරවලට රැවටිලා මුදල් දීලා හැම මාසෙම 15-20 ක් විතර ශ්‍රී ලංකාවෙන් මෙහාට එනවා. මේක හරිම ඛේදවාචකයක්. මේ තත්ත්වය නතර විය යුතුයි. මෙහේ රස්සා නැහැ. එන්නට එපා කියා තරුණයින්ගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. රජයද මෙම තත්ත්වයට වගකිව යුතුයි.

ක්වාලාලාම්පූර් බ්‍රික්ෆීල්ඩ් බෞද්ධ මහා විහාරයේ කොටුවිල සිරිධම්ම හිමියෝ- අපේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ සමාජ සත්කාරක වැඩ සටහනට අනුව දැන් කාලෙක ඉඳලා මෙරට අතරමංවන ශ්‍රී ලාංකිකයින්ගේ සුභසාධනයද සලසනවා ඒ අයට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය පන්සලෙන් සපයනවා.

ඒ සමගම ආපසු ඔවුන් ලංකාවට යැවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා.

මැලේසියාවේ ශ්‍රී ලංකා නියෝජ්‍ය තානාපති මේජර් ජනරාල් උදය පෙරේරා මහතා:- "මම මෙහාට ඇවිත් වසරයි. ශ්‍රී ලංකාවෙන් මෙහාට රැකියා සඳහා පැමිණ සිටින විගමනිකයින්ගේ ප්‍රශ්න හරිම සංකීර්ණයි. මේ වන විට ඊට වගකිවයුතු සියලුම පාර්ශව ගෙන්වා සාකච්ඡා කරමින් සිටිනවා. දැනට තානාපති කාර්යාලයේ රැකවරණය යටතේ සිටින සියලුම පිරිස් ලංකාවට යැවීමට අවශ්‍ය කටයුතු යොදා තිබෙනවා. තානාපති කාර්යාලයේ නිලධාරියකු මුදල් ඉල්ලන බවට මෙතෙක් කිසිදු පැමිණිල්ලක් ලැබී නැහැ. ඒත් මේ සම්බන්ධයෙන්ද අවධානය යොමු කර තිබෙනවා.

මැලේසියාවේ නීතිවිරෝධී ලෙස රැඳී සිටියදී අත්අඩංගුවට පත් ශ්‍රී ලාංකිකයන් 88 දෙනකු පමණ මේ වන විට ආගමන විගමන නිලධාරීන් භාරයේ පසුවෙන බවද හෙළිවිය.

විවිධ චෝදනා මත අත්අඩංගුවට ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් මැලේසියා බන්ධනාගාරයක පසුවන බවද අනාවරණය විය.

මැලේසියාවේ අතරමංව සිටින ශ්‍රී ලාංකිකයන් පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කිංස්ලි රණවක මහතාගෙන් විමසූවිට ඒ මහතා කියා සිටියේ එම පිරිස් පිළිබඳව තානාපති කාර්යාල නිලධාරීන් සමග සාකච්ඡා කොට කඩිනමින් අවශ්‍ය පියවර ගන්නා බවය.

තානාපති කාර්යාලයේ නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීම තානාපති කාර්යාලයේ වගකීමක් බවද හෙතෙම කියා සිටියේය.